# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,153 — 1960 ජූලි 1 වැනි සිකුරාද — 1.7.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල්කිරීම පිළිබඳ දැන්වීම් :—** | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්** ... | 309 |
| **ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්** ... | — |
| **ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්** ... | — |
| **ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්** ... ... | 316 |
| **ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම** ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : කෘඉඒ 561/ජේ58/59 එස් 775.

### 1954දේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබා ගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954දේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටාලලාගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙණහිර සියනෑකෝරලේ ගුරුවල පිහිටි අක්කරයක පමණ විශාලකම් ඇති පින්නලන්දෙවත්ත යන ඉඩම.

ඊට මායිම් :—

උතුරට, නැගෙණහිරට සහ දකුණට : හේනධීර කන්කානමලාගේ පවිලිස් අප්පුහාමි අයිතිකම් කියන මෙම ඉඩමේම ඉතිරි කොටස් ; බස්නාහිරට : කරත්ත පාර.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1960 ජූනි මස 20 වැනි දින,
කොළඹ දීය.

### 1954දේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත වූ විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954දේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටාලගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

1. කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ ඇඹිගමුවේ පිහිටි ගැමැක්කුඹුර නමැති ඉඩමෙන් පාර්චස් 29ක පමණ විශාලකම් ඇති කොටසකට මායිම් :—

උතුරට : හෙට්ටිගේ ඔය ; නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස්.

2. කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ දැඩිගමුවේ පිහිටි චතුරණවත්ත නමැති ඉඩමෙන් පාර්චස් 02ක් පමණ ඇති කොටසකට මායිම් :—

උතුරට සහ බස්නාහිරට : එම ඉඩමේම කොටස් ; නැගෙනහිරට : එම ඉඩමේම කොටස සහ ඔය ; දකුණට : ඔය.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමති.

අංකය : කිව්.බී 406/ජේ 58/59 ඇල් 931.

1960ක් වූ ජූනි මස 1 වැනි දින,
කොළඹදීය.

---

## 1954ජේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950ශේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954ජේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950ශේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටාලගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

(1) කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළයේ 'ඒ' කොට්ඨාශයේ ආඩිඅම්බලමේ පිහිටි 'දඹුව ඇස්ටේට්' නමැති වත්තෙන් අක්කර 0, රූ. 0, පාර්චස් 27.62ක පමණ විශාලකම් ඇති කොටසකට මායිම් :—

උතුරට : මීගමුව-මිනුවන්ගොඩ පී. ඩබ්ලිව්. ඩී. පාර ; නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට සහ බස්නාහිරට : ආංඩි අම්බලම ඔය.

(2) කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළයේ 'ඒ' කොට්ඨාශයේ ආඩිඅම්බලමේ පිහිටි 'දඹුව ඇස්ටේට්' නමැති වත්තෙන් අ. 0, රූ. 0, ප. 26.74ක පමණ විශාලකම් ඇති කොටසකට මායිම් :—

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස සහ ආඩිඅම්බලම ඔය ; දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට ආඩිඅම්බලම ඔය.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමති.

අංකය : කියුබී 417/ජේ 59/60 ඇල් 166.

1960ක් වූ මැයි මස 27 වැනි දින,
කොළඹදීය.

---

අංකය : 3/40/197.

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950ශේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කායඝියක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම් හා ඉඩම් අමාත්‍ය මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950ශේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :

මාතලේ දිස්ත්‍රික්කයේ, උතුරු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ උඩුගොඩ උඩසිය පත්තුවේ, අම්බොක්ක ගම්මුලාදැනි කොටසේ, මාන්නින්ගමුව ගමේ පිහිටි (අ. ග. සි. 48හි බිම් කට්ටි 11) වැකුඹුරේ වත්ත හෙවත් ඇල්හේන්පිටිය නමැති ඉඩමෙන් අඩි 600 × අඩි 12 සහ අඩි 230 × අඩි 12ක බිම් ප්‍රමාණයක් ඇති බිම් කට්ටි දෙක සහ ඒවාට මායිම් :

(1) වැකුඹුරේවත්ත හෙවත් ඇල්හෙන්පිටිය ඉඩමෙන් අඩි 600 × අඩි 12

උතුරට : ඩී. ඇම්. බන්ඩාරමැනිකා අයිතිකම් කියන වැකුඹුරේවත්ත හෙවත් ඇල්හෙන්පිටිය නමැති ඉඩම (රජයට ගැනීමට බලාපොරොත්තුවන ඉඩම) ; නැගෙනහිරට : ඇම්. ජී. පුන්චා තවත් අය අයිතිකම් කියන වැකුඹුර නමැති ඉඩම (අ. ග. සි. 48 ගි බිම් කට්ටි 7න් කොටසක්) ; දකුණට : කෙන්ට්වත්තට යන පාර (අ. ග. සි. 48 ගි බිම් කට්ටි 66) ; බස්නාහිරට : මෙම ඉඩමේ ඉතුරු කොටස.

(2) වැකුඹුරේවත්ත හෙවත් ඇල්හේන්පිටිය ඉඩමෙන් අඩි 230 × අඩි 12

උතුරට : ඩී. ඇම්. බන්ඩාරමැනිකා අයිතිකම් කියන නිකකොටුවේ කුඹුර හෙවත් වැකුඹුර (අ. ග. සි. 48ගි බිම් කට්ටි 7හි කොටසක්) සහ පාරට වෙන්කර ඇති ඉඩම (අ. ග. සි. 48 ගි බිම් කට්ටි 9 බී) ; නැගෙනහිරට : ඇම්. ජී. පුන්චා සහ තවත් අය අයිතිකම් කියන වැකුඹුර නමැති ඉඩම (අ. ග. සි. 48 ගි බිම් කට්ටි 7න් කොටසක්) ; දකුණට : ඩබ්ලිව්. ඇස්. බී. සිල්වා සහ යූ. ජී. ජයසේකර අයිතිකම් කියන වැකුඹුරේවත්ත හෙවත් ඇල්හේන්පිටිය නමැති ඉඩම (රජයට ගැනීමට බලාපොරොත්තුවන ඉඩම) ; බස්නාහිරට : මෙම ඉඩමේ ඉතුරු කොටස.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් ඇමති.

සඳහන් අංකය : ජේ59/60 ඇල් 333 (වී.ඊ).

1960 ජූනි 1 වැනි දින,
කොළඹ.

---

අංකය : 3/41/84.

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950ශේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කායඝියක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම් හා ඉඩම් අමාත්‍ය මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950ශේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :

මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ, මාතලේ නගර සීමාව තුළ, කොට්ඨාශ අංක 6 හි, හිට්ගොල්ල ගමේ පිහිටි, නුවර වීදියේ (අංක අයි 15/60 ඞී නැගෙනහිර දරණ මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 34 වශයෙන් පෙන්නුම් කෙරෙන) තක්සේරු අංක 91 දරණ දියබුබුලේවත්ත හෙවත් බොරලුවේවත්ත නමැති ඉඩමෙන් අඩි 80 × අඩි 15ක පමණ බිම් ප්‍රමාණය, සහ ඊට මායිම් :

උතුරට : වාරියපොලවත්තේ කොටසක්, තක්සේරු අංක 85, නුවර වීදිය ; නැගෙනහිරට : දුම්රියපාරට වෙන්කර ඇති ඉඩම ; දකුණට : මෙම ඉඩමේ ඉතුරු කොටස ; බස්නාහිරට : ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් ඇමති.

සඳහන් අංකය : ජේ 59/60 ඊ 69.

1960 මැයි මස 3 දින,
කොළඹදීය.

---

අංකය : 3/41/101.

## 1954 අංක 39 දරන ඉඩම් අත්කරගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950ශේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම් මහජන කායඝියක් සඳහා අවශ්‍යය යයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බන්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950ශේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මේයින් ප්‍රකාශ කරමි.

මාතලේ දිස්ත්‍රික්කයේ, නැගෙනහිර මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ වේරගම ගම්මුලාදැනි කොටසේ, පල්ලේ වේරගම ගමේ පිහිටි ගොනාටුවේකුඹුර සහ ගොනාටුවේ වත්ත නමැති ඉඩම්වලින් පර්චස් 4.18ක් පමණ බිම් ප්‍රමාණයක් ඇති එකට යාව ඇති බිම් කට්ටි දෙක සහ ඊට මායිම් :—

බිම් කට්ටි : 1.

පර්චස් 3.5ක් පමණ ඇති ගොනාටුවේ කුඹුර.

උතුරට : මෙම ඉඩමේ ඉතුරු කොටස ; නැගෙනහිරට : එස්. බී. ඇල්කඩුව අයිතිකම් කියන ගොනාටුවේ වත්ත (රජයට ගැනීමට

බලාපොරොත්තු වන ඉඩම); දකුණට: මහ ඇල; බස්නාහිරට: ඇල.

**බිම් කට්ටි: 2.**

පර්චස් 1.13ක පමණ වූ ගොනටුවේ වත්ත.

උතුරට සහ නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතුරු කොටස; දකුණට: මහ ඇල; බස්නාහිරට: එස්. බී. ඇල්කඩුව අයිතිකම් කියන ගොනටුවේ කුඹුර (රජයට ගැනීමට බලාපොරොත්තුවන ඉඩම).

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් ඇමති.

සඳහන් අංකය: ජේ 59/60 ඒ. ඈර්ජ්. 328.

1960 ජූනි මස 1 දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බන්ඩා නාමැති මම මෙයින් ප්‍රකාශකරමි:

මාතර දිස්ත්‍රික්කයේ, ගගබඩ පත්තුව ආදයම් නිලධාරි කොට්ඨාශය තුළ, හෙට්ටියාවල ගම්මුලාදෑනි වසමේ, හෙට්ටියාවල බටහිර පිහිටි බිම් ප්‍රමාණයෙන් අක්කර 1 3/4ක් පමණ වූ දංගහමුලන හා පාලුවත්ත නමැති ඒකාබද්ධ ඉඩම් දෙකක්, ඊට මායිම්:—

උතුරට: කේ. ජී. අන්දරයස් ද සිල්වා සහ තවත් අය හිමිකම් කියනා ඉහළමුතුවජ්ජදෙනිය නාමැති ඉඩම ද; නැගෙණහිරට: එස්. එල්. බබහාමි සහ තවත් අය හිමිකම් කියන මුංකොරටුව නාමැති ඉඩම සහ ඩී. සී. ඒ. ඩබ්ලිව්. දිසානායක සහ තවත් අය හිමිකම් කියන හෙන්දකැටිය නාමැති ඉඩම ද; දකුණට: ඩී. සී. ඒ. ඩබ්ලිව්. දිසානායක හිමිකම් කියන හෙන්දකැටිය නාමැති ඉඩම ද; බටහිරට: කෝංගලයපිට්ටෙන්න නාමැති ඉඩම සහ කේ. ජී. අන්දරයස් සහ තවත් අය හිමිකම් කියන ඉහළමුතුවජ්ජදෙනිය ද වේ.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමති.

සඳහන් අංකය: ජේ. 58/59 ඊ. 58—එල්. බී. 2385.

1960ක් වූ මැයි මස 16 වැනි දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා නාමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

මාතර දිස්ත්‍රික්කයේ, ගගබඩ පත්තුව ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ, නාදුගල ගම්මුලාදෑනි වසමේ, පරනාදුගල ගමේ පිහිටි, මහවත්ත නාමැති ඉඩමෙන්, එකතුව බිම්ප්‍රමාණය අක්කර 0, රූඩ් 3, පර්චස් 10ක් පමණවූ (මාතර දිස්ත්‍රික් උසාවියේ අංක 16,692 දරණ නඩුවට අදාල අංක 1,635 දරණ බෙදා වෙන්කිරීමේ සැලැස්මේ කැබැලි අංක 5, 9 හා 13) ඒකාබද්ධ ඉඩම් කැබලි තුනක්, ඊට මායිම්:—

උතුරට: ජිනදාස කුමාණායක්‍ෂ හිමිකම් කියන මහහේන නොහොත් හේනෙගෙවත්ත නාමැති ඉඩම ද; නැගෙනහිරට: අංක ඒ. 1,756 දරණ මූලික සැලැස්මේ අංක 3 හා 4 දරණ කැබලි ද; දකුණට: අංක ඒ. 1,756 දරණ මූලික සැලැස්මේ අංක 14 දරණ කැබැල්ල ද; බටහිරට: ඊ. රූබසිංහ හිමිකම් කියන මහවත්ත නාමැති ඉඩමේ කොටසක් ද වේ.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමති.

සඳහන් අංකය: ජේ 59/60 ඩබ්ලිව් 24 එල් බී 2429.

1960ක් වූ මැයි මස 16 වැනි දින,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ මොහොට්ටාලලාගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි: 1960ක් වූ මැයි මස 3 වැනි දින,

මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදයම් නිලධාරි කොටසේ, මාතර නගර සභා සීමාව තුළ, අංක 3 මැද්දෙවත්ත ඡන්ද කොට්ඨාශයේ, බ්‍රවුන්ස් හිල් පාරේ, වරිපණම් අංක 25 දරණ පැඟිරිවත්ත නොහොත් කුරුඳුවත්ත නාමැති ඉඩමෙන් බිම් ප්‍රමාණයෙන් පර්චස් 8ක් පමණවූ බිම් කැබැල්ලක්, ඊට මායිම්:—

උතුරට හා බටහිරට: අංක 13,300 මූලික සැලැස්මේ අංක 3 දරණ කැබැල්ලද; නැගෙනහිරට: එම ඉඩමේ ඉතිරි කොටසද; දකුණට: බ්‍රවුන්ස් හිල් පාරද වේ.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමති.

සඳහන් අංකය: ජේ. 59/60 එච්ඒ 293—එල් බී. 2444.

1960ක් වූ මැයි මස 3 වැනි දින,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ මොහොට්ටාලලාගේ ඩිංගිරි බණ්ඩා නාමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළය ආදයම් නිලධාරි කොට්ඨාශය තුළ, කළුබෝවිටියන ගම්මුලාදෑනි වසමේ, දංගල පිහිටි මහකුඹුර නාමැති ඉඩමෙන් බිම් ප්‍රමාණයෙන් පර්චස් 6ක් පමණ වූ ඉඩම් කැබැල්ලක්, ඊට මායිම්:—

උතුරට: එම ඉඩමේම ඉතිරි කොටසද; නැගෙනහිරට: තිරුවානගොඩවත්තෙහේන නාමැති ඉඩම ද; දකුණට: තිරුවානගොඩවත්තෙහේන නාමැති ඉඩම සහ අංක 24 දරණ අවසාන ගම් සිතියමේ කැබැලි අංක 7 ද; බටහිරට: (රජය සතු) කෝවිලවත්තෙහේන දෙනිය නාමැති ඉඩම සහ ඩී. ඩී. යාපා හිමිකම් කියන මහවිලහේන නොහොත් මහකුඹුරහේන නාමැති ඉඩම් ද වේ.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමති.

සඳහන් අංකය: ජේ. 57/58 එල්. 287 (වීඊ)—එල්. බී. 2347.

1960ක් වූ මැයි මස 3 වැනි දින,
කොළඹදීය.

### 1954රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරනු ලැබූ 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරනු ලැබූ 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ විජයානන්ද දහනායක නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

පහත සඳහන් මායිම් තුළ පිහිටා ඇති, වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරළේ මුහුදු වෙරළේ ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශයේ හලාවත නගර සභා සීමාව, කොළඹ පාරේ වරිපනම් අංක 35/1 සී දරන පතාමරතාඩි කානි නොහොත් සලාවැලි නැමති ඉඩමෙන් පර්චස් 26.27ක් පමණ බිම් කැබැල්ලක්. ඊට මායිම් :—

උතුරට : විජයමාවත පාර ; නැගෙනහිරට : ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා විසින් හිමිකම් පාන පනාමාරත්තාඩි තෝටම් නොහොත් සේලවැලි නැමති ඉඩම ; දකුණට : ස්ටීවන් මහතා විසින් හිමිකම් පාන පනාමාරත්තාඩි තෝටම් නොහොත් සේලවැලි නැමති ඉඩම ; බස්නාහිරට : ඇම්. ඇස්. ප්‍රනාන්දු මහතා විසින් හිමිකම් පාන පනාමාරත්තාඩි තෝටම් නොහොත් සේලවැලි නැමති ඉඩම.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

යොමු අංකය : ජේ 58/59 ඇස් 698.

1960ක්වූ පෙබරවාරි මස 8 වැනි දින,
කොළඹදීය.

---

### 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයිද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කරගනු ලැබේයයිද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාල්ලාගේ ඕංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ රත්මලේ තුලානේ, ගල්ඔය හන්දිය ගමේ පිහිටි අංක 11 දරන අවසාන ටෝපෝ සිතියමේ අංක 613 දරන කැබෙල්ල වශයෙන් දැක්වෙන දෙනියවැව කැලේ, ගල්ඔය කැලේ, දමනේ මූකලාන, කල්ලෝඩයිකඩු යන ඉඩමේ කොටසක් වන අක්කරයක ඉඩම, ඊට මායිම් :—

උතුරට : ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට අයත් කුඩා පාර ; නැගෙනහිරට : එස්. කේ. සයිමන් මහතාට ඉඩම් සශ්‍රීක කිරීමේ ආඥාපනත යටතේ දී තිබෙන (දැනට අත්හැර දමා ඇති) ඉඩම ; දකුණට : (කැබෙලි කළ) රජයේ ඉඩම ; බස්නාහිරට : එච්. ඇම්. පෙරේරා මහතාට ඉඩම් සශ්‍රීක කිරීමේ ආඥාපනත යටතේ දී තිබෙන ඉඩම.

(බදු අයිතිවාසිකම් අත්පත් කරගෙන යනු ලැබේ.)

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම සහ ඉඩම් ඇමති.

සඳහන් අංකය : ජේ 59/60 එල් 60/එල්කිව්/ඒ. 21.

1960 ජූනි මස 1 දින,
කොළඹදීය.

---

### 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

මූලික සැලැස්මේ නො. ඒ. 4,481—ගම : බ්‍රාහ්මණගම

**කැබැල්ල : 1.**

ඉඩමේ නම : දෙල්ගහවත්ත ; විස්තරය : අවුරුදු 20ක කොස් ගහක් සහ රබර්ගස් 34 ඇති රබර් ඉඩම ; අයිතිකම්කියන අය : රණසිංහ ආරච්චිගේ දොන් ඒබ්‍රහම්, රණසිංහ ආරච්චිගේ දොන් ඩේවිඩ් සිංඤෝ, රණසිංහ ආරච්චිගේ දොන් සෙලෙස්තිනාහාමි, මාදිවල ලියනගේ රූපා රණසිංහ, මාදිවල ලියනගේ රූපසිංහ, සියළු දෙනාම බ්‍රාහ්මණගම, හෝමාගම ; රණසිංහ ආරච්චිගේ කරෝලිස්, 751, ලේක් පාර, බොරලැස්ගොමුව ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 38.7.

**කැබැල්ල : 2.**

ඉඩමේ නම : දෙල්ගහවත්ත ; විස්තරය : අවුරුදු 5ක කජුගස් 3ක්, අවුරුදු 20ක කොස්ගස් 2ක්, සහ අවුරුදු 5-20සේ පොල් ගස් 42ක් සහ පුවක් ගස් 45ක් ඇති ඉඩම ; අයිතිකම්කියන අය : දෝන චලෝ නෝනා වික්‍රමසිංහ සහ හතමුනගේ ගුණසේකර, දෙදෙනාම බ්‍රාහ්මණගම, හෝමාගම ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 04.6.

**එකතුව : අ. 0, රූ. 2, ප. 03.3.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් 1960 අගෝස්තු මස 16 වැනි දින පෙරවරු 10ට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 අගෝස්තු මස 6 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ආර්. ද සිල්වා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත.

අංක : කිව්.බී. 330.

1960ක්වූ ජූනි මස 25 දින,
කොළඹ කච්චේරියේදීය.

---

### 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර:—

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ නත්තරන්පොත ගම්මුලාදෑනි කොට්ඨාශයේ උඩගම්පහ කෝරළේ නත්තරන්පොත ගමෙහි පිහිටි ගල්මඩුව වතුයායේ ප්‍රමාණයෙන් අක්කර 7, රූඩ් 0, පර්චස් 39.1ක්වූ මූලික සිතියම් අංක පී. පී. ඒ. 2697හි පහත සඳහන් අය විසින් අයිතිවාසිකම් කියන බිම් කැබලි :—

කැබලි අංක 1—ප්‍රමාණය: අ. 3, රූ. 1, පර්චස් 31.5; පේරාදෙනියේ පදිංචි සී. ආර්. කරුනාරත්න අයිතිවාසිකම් කියති.

කැබලි අංක 2—ප්‍රමාණය: අ. 0, රූ. 3, පර්චස් 13.8; කොළඹ බුලර්ස් පාරේ පදිංචි එච්. ඇස්. ගුණසේකර අයිතිවාසිකම් කියති.

කැබලි අංක 3—ප්‍රමාණය: අ. 0, රූ. 3, පර්චස් 15.3; මහනුවර පදිංචි ජී. ඩබ්ලිව්. කරුනාරත්න අයිතිවාසිකම් කියති.

කැබලි අංක 4—ප්‍රමාණය: අ. 0, රූ. 3, පර්චස් 03.6; කොළඹ පදිංචි ඇල්. සී. ගුණසේකර අයිතිවාසිකම් කියති.

කැබලි අංක 5—ප්‍රමාණය : අ. 0, රූ. 1, පර්චස් 00.7 ; කොළඹ බුලර්ස් පාරේ පදිංචි ඇල්. ජී. ගුණසේකර අයිතිවාසිකම් කියති.

කැබලි අංක 6—ප්‍රමාණය: අ. 1, රූ. 0, පර්චස් 02.5; මහනුවර කටුකැලේ පදිංචි ජී. ඩබ්ලිව්. ඒකනායක අයිතිවාසිකම් කියති.

කැබලි අංක 8—ප්‍රමාණය: අක්කර 0, රූ. 0, පර්චස් 08.4; පේරාදෙනියේ පදිංචි සී. ආර්. කරුනාරත්න අයිතිවාසිකම් කියති.

කැබලි අංක 9—ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්චස් 03.3 ; කොළඹ පදිංචි එච්. ඇස්. ගුණසේකර අයිතිවාසිකම් කියති.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ වෂී 1960ක්වූ අගෝස්තු මස 3 වෙනි දින පූ. භා. 10 ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද, වෂී 1960ක්වූ ජූලි මස 27 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම් ලබාගැනිම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. ඉඩම් සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකර ගැනීම පිණිස සහ එකී ඉඩම් ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධව ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධයෙන් පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

මගේ අංකය : ඇල්. ඩී. ඇිජ්.—25.

වෂී 1960ක්වූ ජූනි මස 21 දින
මහනුවර කච්චේරියේදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩුගම්පහ කෝරළේ හෙව්විගම්මැද්ද ගමෙහි පිහිටි මහර මුදියන්සේලාවත්තෙන් ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ් 2, පර්චස් 30.4ක්වූ මැන විස්තර කරන ලද ගුත්තැපානේ පදිංචි ජේ. රනතුංග මහතා විසින් අයිතිවාසිකම් කියන ලද ඉඩම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 අගෝස්තු මස 3 වැනි දින අපරභාග 3.45ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 ජූලි මස 27 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද එකී ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
ම. දි. ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1960 ජූනි මස 22 වැනි දින,
මහනුවර කච්චේරිය.

---

## 1954රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත්. එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටල්ලාගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තු ආදායම් නිලධාරි කොට්ඨාශයේ වටුවල ගම්මුලාදැනි කොට්ඨාශයේ වටුවල ගමෙහි පිහිටි පන්සලේ වත්ත සහ අටලාගේවත්ත නැමති ඉඩම්වලින් එකතුව ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 1, පර්චස් 0.2ක් පමණවූ පහත මායිම් සඳහන් බිම් කැබලි දෙක :—

**1. පන්සලේවත්ත—ප්‍රමාණයෙන් පර්චස් 10ක් පමණවූ.**

උතුරට : ඇල ; නැගෙනහිරට සහ දකුණට : රජය සතු බිබිලේවැන්න නොහොත් පරන උයන්වත්ත ; බස්නාහිරට : පී. බී. වෙරල්ලගම සහ අනිකුත් අය අයිතිවාසිකම් කියන උයන්වත්තකුඹුර.

**2. අටලාගේවත්ත—ප්‍රමාණයෙන් පර්චස් 32 පමණවූ.**

උතුරට සහ නැගෙනහිරට : ඇල ; දකුණට සහ බස්නාහිරට : රජය සතු බිබිලේතැන්න නොහොත් පරන උයන්වත්ත.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

ජේ 57/58 පී. 384 ඇල්. ඩී. ඩී. 11.

1960ක්වූ අප්‍රේල් මස 4 වැනි දින,
කොළඹදීය.

---

අංකය : 3/42/35.

## 1954රේ අංක 39 දරන ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරන ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

පිඹුර : ඒ 2,608 දරණ මූලික පිඹුර ; ගම : මාතලේ නගර සීමාව තුළ කොට්ඨාශ අංක 2 හි අගලවත්ත-බෝපේතැන්න, පන්නගම ගම.

**බිම් කට්ටිය 5**

නම : රූප්පගාවාවත්ත අගලවත්ත පාරේ, තක්සේරු අංක 82, කොටසක් ; විස්තර : අවුරුදු 40ට වැඩි පුවක් ගස් එකක් ඇති ඉඩම ; අයිතිකම් කියන්නා : මාතලේ අංක 2 දරණ අගලවත්ත පටු මාවතේ අංක 39/1 හි කේ. වයි. අරුමා ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.49.

**එකතුව : අ. 0, රූ. 0, ප. 01.49.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 අගෝස්තු 1 වැනි දින පූ.භා. 10ට මාතලේ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 ජූලි මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇන්. ඩබ්ලිව්. එච්. ඩී. ගුණරත්න,
මාතලේ දිස්ත්‍රික්කයේ රජයට ඉඩම් අත්කරගන්නා නිලධාරී.

1960 ජූනි මස 16 වැනි දින,
මාතලේ කච්චේරිය.

---

අංකය : 3/41/77.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

පිඹුර : අංක ඒ 2,681 දරණ මූලික පිඹුර ; ගම : දිවිල්ල.

**බිම් කට්ටිය : 1.**

නම : ඩන්ගන්වත්ත ; විස්තරය : අවුරුදු 30 ට වැඩි රබර් ගස් 41ක් ඇති ගල් වල ; අයිතිකම් කියන්නා : පූජාපිටියේ ඇම්. කේ. සෙයියදු මොහම්මදු ; ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 05.9.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 අගෝස්තු 1 වැනි දින පූ. භා. 11 ට මාතලේ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 ජූලි 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණින් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇන්. ඩබ්ලිව්. එච්. බී. ගුණරත්න,
මාතලේ දිස්ත්‍රික්කයේ රජයට ඉඩම් ගන්නා නිලධාරී.

1960 ජූනි 16 වැනි දින,
මාතලේ කච්චේරිය.

---

අංකය: 3/40/138

## 1954රේ අඩක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අඩක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

පිඹුර: අංක ඒ. 2,691 දරණ මූලික පිඹුර; ගම: ඇල්කඩුව

**බිම් කට්ටිය : 1.**

නම: ඇල්කඩුව වත්ත; විස්තර: අඩි පාරකින් කොටසක් සහිත පතණ; අයිතිකම් කියන්නා: රන්ගල කොන්සලිඩේටට් නියෝජිතයෝ, සීමාසහිත ලිව්මන් සහ සමාගම, තැ. පෙ. අංක 83, කොළඹ; ප්‍රමාණය: අ. 5, රූ. 2, ප. 14.9.

**බිම් කට්ටිය : 2.**

නම: ඇල්කඩුව වත්ත; විස්තර: දෙනිය; අයිතිකම් කියන්නා: රන්ගල කොන්සලිඩේටට් නියෝජිතයෝ, සීමාසහිත ලිව්මන් සහ සමාගම, තැ. පෙ. අංක 83, කොළඹ; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 06.4.

**බිම් කට්ටිය : 3.**

නම: ඇල්කඩුව වත්ත; විස්තර: අඩි පාරකින් කොටසක් සහිත දෙනිය; අයිතිකම් කියන්නා: රන්ගල කොන්සලිඩේටට් නියෝජිතයෝ, සීමාසහිත ලිව්මන් සහ සමාගම, තැ. පෙ. අංක 83, කොළඹ; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 17.6.

**බිම් කට්ටිය : 4.**

නම: ඇල්කඩුව වත්ත; විස්තර: අතු සෙවිලිකළ, මඩ බිත්ති ඇති තාවකාලික ගොඩනැගිලි 3ක් ද, අවුරුදු 3-5 දක්වා වූ කෙසෙල්, පැඟිරි, කොස්, පුවක්, අඹ සහ දෙල් ගස් ඇති ඉඩම සහ අඩිපාරකින් කොටසක්; අයිතිකම් කියන්නා: රන්ගල කොන්සලිඩේටට් නියෝජිතයෝ, සීමාසහිත ලිව්මන් සහ සමාගම, තැ. පෙ. අංක 83, කොළඹ; ප්‍රමාණය: **අ. 8, රූ. 1, ප. 10.0.**

**එකතුව: අ. 14, රූ. 1, ප. 08.9.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 1960 අගෝස්තු මස 17 වැනි දින පූ. භා. 9.30 ට මාතලේ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද, 1960 අගෝස්තු මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණින් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වී. පී. ඒ. පෙරේරා,
මාතලේ ආණ්ඩුවේ ඒජන්තතැන.

1960 ජූනි මස 17 වැනි දින,
මාතලේ කච්චේරිය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශෝධිතවූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපෙරොත්තු වන ඉඩමේ විස්තර.—

ලොට් අංක: 2,662 දරණ මූලික ගම්මැනීමේ පිඹුරයේ 1

ඉඩමේ නම: බෝගහවත්ත; විස්තරය: ස්ථිර ගොඩනැගිලි 5කින් හා ස්ථිර වැසිකිලි 3කින් යුත් (සින්ක් ෂීට් සෙවිලිකළ ගඩොල් බිත්ති වලින් යුත්) අවුරුදු 40කට වඩා පැරණි ගෙවත්ත; තාවකාලික ගොඩනැගිලි 3ක් (එකක් ලී වලින් තැනූ සින්ක් ෂීට් සෙවිලි කර තිබේ. එකක් සින්ක් ෂීට් සෙවිලි කර ඇති අතර අනික සින්ක් ෂීට්වලින් සාදා ඇත. කටුමැටිගැසූ බිත්තිවලින් යුක්තය. සෑදු ලිඳක් ඇත, අඩිපාර; දොඩම් ගස් 16, අඹගස් 11 යි, කොස් ගස් 9 යි, දෙහිගස් 4 යි, පේරගස් 10 යි, හපුගස් 3 යි, උක පඳුරු 3 යි, ජම්බු ගස් 2 යි, කරපිංචා ගස් 11 යි, කෝපි ගස් 57 යි, කිතුල් ගස් 10 යි, කෙසෙල් පඳුරු 287 යි, පොල් ගස් 1 යි, දෙලුම් ගස් 1 යි, අවුරුදු 1 සිට 40 දක්වා වූ. අයිතිකරුවෝ: රාජවෙල ප්‍රොඩියුස් කොම්පැනි ලිමිටඩ්, ඒජන්තවරු: ගෝර්ඩන් ප්‍රේසර් සහ කොම්පැණිය ලිමිටඩ්, කොළඹ; ප්‍රමාණය: අ. 4, රූ. 1, ප. 16.6.

අඩිපාර; ප්‍රමාණය; අ. 0, රූ. 0, ප. 02.0.

**මුළු ගණන අ. 4, රූ. 1, ප. 18.6.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 අගෝස්තු 17 වැනි දින පූ. භා. 10.30 බෝගහ වත්තේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 අගෝස්තු 8 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණින් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ෆේප්‍රාස්ටර්,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරි තැන.
නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඉඩම් ලබාගැනීමේ නිලධාරි තැන.

1960 මැයි 19 වැනි දින,
නුවරඑළියේ කච්චේරිය.

---

සඳහන් අංකය: ඇල් ඕ/ඇල් ඊ/112.

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාය්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර:—

අංක 2,667 දරණ මූලික ගම්මැනීමේ ප්ලෑනේ අංක 1 සහ 2 ලොට් වලින් පෙන්වන නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ හපුගස්තලාව ගම්මුලාදැනි කොට්ඨාශයේ හපුගස්තලාව ගමෙහි පිහිටි පහත සඳහන් ඉඩම් කට්ටි.

**ලොට් අංකය : 1.**

ඉඩමේ නම: මහවිලා වතුයායේ යකිනිගල කොටස; විස්තරය: අවුරුදු 60කට වැඩියෙන් පැරණි තේ ඇති අඩිපාරක් ජල නලයක්, පර්වතයක් හා තේ; අයිතිකරුගේ නම: ඉංග්‍රීසි හා ස්කොට්ලන්ත සමුපකාර තොග වෙළඳ සමිති සමාගම, යූනියන් ප්ලේස්, කොළඹ 2; ප්‍රමාණය: අ. 16, රූ. 3, ප. 10.

**ලොට් අංකය : 2.**

ඉඩමේ නම: මහවිලා වතුයායේ යකිනිගල කොටස: විස්තරය; පාර; අයිතිකරුගේ නම: ඉංග්‍රීසි හා ස්කොට්ලන්ත සමුපකාර තොග වෙළඳ සමිති සමාගම, යූනියන් ප්ලේස්, කොළඹ—2; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 20.

**එකතුව: අ. 17, රූ. 0, ප. 30.**

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 අගෝස්තු මස 11 වෙනි දින පස්වරු 3ට මහවිලා වතුයායේ කාය්‍යාලයේදි මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දී මුදලේ විස්තරද, ඉල්ලන

වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1960 අගෝස්තු 3 වෙනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයිද නියම කරමි.

සී. ජේප්‍රාස්ටර්,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරි තැන.

1960 ජූනි මස 23 වැනි දින,
නුවරඑළියේ කච්චේරිය.

---

අංකය: ඇල් ඒ/ඇෆ්/7582—ජේ 57 ඇල් 153.

## 1954ජේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954ජේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිතවූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

ප්ලෑන් අංකය: අංක 263 සහ අංක 281 දරණ අවසාන ගම් සිතියමේ 1 වෙනි අතිරේකය.

**කැබැල්ල අංකය: 516 (අ. ග. සි. අංක 263)**

ඉඩමේ නම: කහදගගමුලාන; ඉඩමේ විස්තර: කුඹුර; අයිතිකම් කියන අය: මහානාමනම් ගිගනගමගේ දෙන් දියෝනිස් සහ ඇම්. ජී. අන්දිරිස් හාමි, ද්මමුල්ල, බෙලියත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.1.

**කැබැල්ල අංකය: 95 (අ. ග. සි. අංක 281)**

ඉඩමේ නම: ගල්පොත්තෙකොරටුව; ඉඩමේ විස්තර: වැව්ල්ලක් නැති පොල් වත්තකින් කොටසක්; අයිතිකම් කියන අය: ඇම්. ජී. අන්දිරිස්හාමි, ඇම්. ජී. දෙන් නිකුලස්, දම්මුල්ල, බෙලියත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.1.

**කැබැල්ල අංකය: 96 (අ. ග. සි. අංක 281)**

ඉඩමේ නම: ගල්පොත්තෙකොරටුව; ඉඩමේ විස්තර: අවුරුදු 20ක් වයස්වූ පොල් ගහක්ද, අවුරුදු 1-2ක් වයස්වූ පොල් ගස් 5ක්ද, අවුරුදු 1-2ක් වයස්වූ පුවක් ගස් 4ක්ද තිබෙන පොල් වත්තක්; අයිතිකම්කියන අය: ඇම්. ජී. අන්දිරිස්හාමි සහ ඇම්. ජී. දෙන් නිකුලස්, දම්මුල්ල, බෙලියත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 03.4.

**එකතුව: අ. 0, රූ. 0, ප. 05.6.**

ඉහත සඳහන් ඉඩම්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බටහිර ගිරුවා පත්තුවේ, පල්ලත්තර සහ හුංගම නැමැති ගම්වල පිහිටා තිබේ.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 අගෝස්තු මස 16 වැනි දින පූ.භා. 10ට බෙලියත්ත ගම්සභා කන්තෝරුවේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 අගෝස්තු මස 7 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීමේ ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ටී. සිවඥනම්,
හම්බන්තොට ආණ්ඩුවේ වැඩ බලන ඒජන්තතැන.

1960 ජූනි මස 24 වැනි දින,
හම්බන්තොට කච්චේරිය.

---

සඳහන් අංකය: 3/63/28—ජේ 57/58 ඊ 415.

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර:—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරලේ, රත්මලේ ගමෙහි පිහිටි අංක ඒ 1,647 දරණ මූලික සැලැස්මේ සඳහන් බිම් කැබැල්ල:—

**ලොට් නො: 1.**

ඉඩමේ නම: පරනහිටිවත්ත නොහොත් පාලුවත්ත; විස්තරය: අවුරුදු 15-20 වයසැති පොල් ගස් 35, අවුරුදු 4-6 වයසැති පොල්ගස් 7 සහ අවුරුදු 2 වයසැති කජු ගසක් සහිත පොල් ඉඩම; අයිතිකරු: බමුනුගෙදර සීලානන්ද ස්ථවිර, රත්නසීල පරිවෙනාධිපති, වැගම, රත්මලේ උනුමිය; ප්‍රමාණය: අ. 0, රූ. 2, ප. 19.1.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 අගෝස්තු මස 5 දින දවල් 12 ට රත්මලේ සිංහල මිශ්‍ර පාසැලේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1960.7.28 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

**සැලකිය යුතුයි.**—අයිතිකරුවන් තමන්ගේ අයිතිය තහවුරු කිරීම සඳහා ඇති සියලුම ඔප්පු මා වෙත විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇම්. ඇල්. ජේ. වික්‍රමරත්න,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

1960 ජූනි මස 22 දා,
කුරුණෑගල කච්චේරිය.

---

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය: 3/63/43—ජේ56ඊ 486.

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1960 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර:—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, මයිරාවතී කෝරලේ, ඇටම්පොළ ගමෙහි පිහිටි අංක 212 දරණ අ. ග. සැ. 2වෙනි අතිරේකයේ සඳහන් බිම් කට්ටි:

**ලොට් නො: 42.**

ඉඩමේ නම: අම්බලන්යායෙවත්ත; විස්තරය: අවුරුදු 20-35 වයසැති පොල් ගස් 71, අවුරුදු 5-15 වයසැති පොල් ගස් 48, අවුරුදු 1½-3 වයසැති පොල්ගස් 24, අවුරුදු 40 පමණ වයසැති කොස්ගස් 1, අවුරුදු 2 පමණ වයසැති කෙසෙල් පඳුරු 3, සහිත පොල් ඉඩම; අයිතිකරුගේ නම: ජයමහ මුදියන්සේලාගේ සියාතු බන්ඩා, දිකිරි වැව මැටියගනේ; ප්‍රමාණය: අ. 1, රූ. 2, ප. 22.7.

**ලොට් නො: 43.**

ඉඩමේ නම: අම්බලන්පොත්තේ වත්ත; විස්තරය: අවුරුදු 30-40 වයසැති පොල්ගස් 26 සහිත පොල් ඉඩම; අයිතිකරුගේ නම: ජයමහමුදියන්සේලාගේ සියාතු බන්ඩා, දිකිරිවැව මැටියගනේ; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 17.7.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 අගෝස්තු මස 10 දින පෙ. ව. 10.30ට හොරොම්බාව මුස්ලිම් පාසැලේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තරද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1960.8.3 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

**සැලකිය යුතුයි.**—අයිතිකරුවන් තමන්ගේ අයිතිය තහවුරු කිරීම සඳහා ඇති සියලුම ඔප්පු මා වෙත විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇම්. ඇල්. ජේ. වික්‍රමරත්න,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

1960 ජූනි මස 22 දාය,
කුරුණෑගල කච්චේරිය.

---

අංකය: ඇල්ඇල්/ඒ. 6135
ජේ 57ඊ. 384.

## 1954ජේ අංක 39 දරන (සංශොධිත) ඉඩම් ලබාගැනීමේ ආඥාපනතින් සංශොධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954ජේ අංක 39 දරන (සංශොධිත) ඉඩම් ලබාගැනීමේ ආඥාපනතින් සංශොධනය කරන ලද 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ උඩපත්තු දකුණේ රත්තුරුගල නමැති ගමේ පිහිටි අංක 379 දරන අවසාන ගම් සිතියමේ 1 වෙනි අතිරේකයේ මැන විස්තර කරන ලද පහත සඳහන් ඉඩම :—

**ලොට් : 143.**

ඉඩමේ නම : ගල්ගොඩේවත්ත ; විස්තර : පතන සහ හේන තුළ පිහිටා තිබෙන සින්ක් තහඩු සෙවිලිකළ ස්ථිර ගොඩනැගිල්ල, සින්ක් තහඩු සෙවිලිකල අළුත් බිත්ති ගෙය තනා ඇති ස්ථිර ගොඩනැගිල්ල, පොල් අතු සෙවිලිකල මැටි බිත්තියෙන් තනා ඇති තාවකාලික ගොඩනැගිල්ල සහ කොන්ක්‍රීට් බැම්මෙන් තනා ඇති වැසිකිළිය ; අයිතිවාසිකම් කියන අය : ගලිමලේ, පාගොඩ ග්‍රාම ස. සමිතිය (ගිලීමලේ ග්‍රා. ස. ස. ලේකම් ජී. වී. ගුණසේන) ගිලීමලේ, රත්තුරුගල යූ. වී. මද්දුම හාමි, මල්වල ඩී. ඇම්. හීන්මහත්මයා . ප්‍රමාණය : අ. 1, රූ. 3, ප. 23.9.

**ලොට් : 144.**

ඉඩමේ නම : ගල්පොත්තෙවෙලේවත්ත ; විස්තර : හේන ; අයිතිවාසිකම් කියන අය : රත්තුරුගල ටී. ඒ. දොන් විජේනායක සහ යූ. වී. මද්දුමහාමි ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 06.9.

**ලොට් : 145.**

ඉඩමේ නම : ගල්ගොඩේවත්ත ; විස්තර : අවුරුදු 60ක්වූ රබර් ; අයිතිවාසිකම් කියන අය : රත්තුරුගල යූ. වී. මද්දුමහාමි ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 08.0.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 අගෝස්තු 24 වැනි දින උදේ 11 වේලාවට රත්නපුර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 අගෝස්තු 15 වැනි දිමට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිගම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එන්. පී. ජෙගනාදන්,
රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

වර්‍ෂ 1960 ක්වූ ජූනි මස 17 දින,
රත්නපුර කච්චේරියේදීය.

---

සඳහන් අංකය : එල්එම්/5740.

## නිවැරදි කිරීමයි

1960 මැයි 20 වැනි දින අංක 12,133 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 3 වැනි කොටසේ ප්‍රසිද්ධ කරණ ලද 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමේ 7 වැනි පේළියේ ප්ලෑන් අංකය පී. පී. ඒ. 985 වෙනුවට පී. පී. ඒ. 986 යයි සඳහන් විය යුතුයි.

---

## ශුද්ධි පත්‍රය

අංකය : 3/63/2-ජේ 58/59 පී 211.

අංක 11,796 හා 1959.7.3 වෙනි දින දරණ ආණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනලද, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ ගරු කෘෂිකර්ම සහ ඉඩම් ඇමතිතුමා විසින් 59.6.15 දින කරන ලද ප්‍රකාශනයේ උතුරු මායිමේ විස්තර වන "පී. බී. පුසුඹා හිමිකම් කියන කහටගහමුල ඉඩම සහ මැහිඇල්ලේ පන්සලට අයිති බෝගහ මූල ඉඩම" වෙනුවට "එම ඉඩමේ ඉතිරි කොටස කියා" වෙනස් කල යුතුය.

---

## නිවැරදි කිරීමයි

සඳහන් අංකය : එල්එම්. 480.

1960 මැයි මස 27 වෙනි දින අංක 12,136 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 3 වෙනි කොටසේ ප්‍රසිද්ධ කරණ ලද 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමේ 8 වැනි පේලියේ මුළු බිම් ප්‍රමාණය අ. 15, රූ. 0, ප. 26 වෙනුවට අ. 21, රූ. 1, ප. 08ක් යයි සඳහන් විය යුතුයි.

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය : ඇල්. ජේ. 1535-3/21/504.

## 21(2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ බලදොර කෝරළයට අයත් කුඩා වීටිකුලිය ගමෙහි අංක 1,569 දරන අවසාන ගම් පිඹුරයේ අංක 34 දරන බිම් කැබැල්ලෙන් අක්කර 3ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් විටිකුලියේ පුණ්‍යවර්ධන එක්සත් සමිතියේ භාරකරුවන් වන, නිකවැරටිය, වීටිකුලියේ පදිංචි බාලසූරිය මුදියන්සෙලාගේ ධර්මපාල බාලසූරිය, කළුආරච්චිගේ පොඩි අප්පුහාමි සහ පොතුපිටි ආරච්චිගේ ජයසේකර යන මහතුන් විසින් එහි බෞද්ධ විහාරස්ථානයක් පිහිටුවීම සඳහා බදු ඉල්ලා ඇත.

2. මෙහි සිට ලඟමවූ බෞද්ධ විහාරස්ථානයට ඇති දුර ප්‍රමාණය සැතපුම් $3\frac{1}{2}$ක් පමණ වේ. මෙම ප්‍රදේශවාසී බෞද්ධ පවුල් 85කට පමණ යෝජිත විහාරස්ථානය ප්‍රයෝජනවත් වේ. ඉඩම මේ සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත.

(අ) බදු මුදල : වර්ෂයකට රු. 1 ශත 50යි ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 5ක් ඇතුළතදී කුරුණෑගල දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි ඉඩමෙහි ආවාසයක්, ධර්මශාලාවක්, විහාරයක්, දානශාලාවක්, දාගැබක් සහ වැසිකිළියක් තනා නිම කළ යුතුය ;

(ඉ) බදු ගන්නන් විසින් මෙම ඉඩම බෞද්ධ විහාරස්ථානයක් තැනීම පිණිස මිස අන් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය ;

(ඊ) බදු ගන්නන් විසින් (ආ) ඡේදයෙහි සඳහන් ගොඩනැගිලි සාදා නිම කොට සමසක් ඇතුළත ඒවා මහා භාරකාර තැනගේ අනුමැතිය ලද ඔප්පුවකින් පූජා කළ යුතුය. මෙසේ කළ පසු, ප්‍රස්ථාවේ හැටියට, භාරකාර තැනට හෝ විහාරස්ථානයේ පාලක විහාරාධිපතීන් වහන්සේට හෝ ඉඩම සඳහා 99 අවුරුද්දක බද්දක් දෙනු ලැබේ.

3. මෙහි පහත දැක්වෙන දිනයේ සිට සති 6ක් ඇතුළතදී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් යථොක්ත ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 ජූලි මස 1 වැනි දින,
කොළඹදීය.

---

අංකය : ඇල්.ජේ. 1792-ඇල්ජී. 4620.

## 21(2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවර ගම් පළාතට අයත් තම්මැන්නාඅලවක ගමෙහි අංක 528 දරණ අවසාන ගම් පිඹුරයේ අංක 6 දරණ බිම් කැබැල්ලෙන් අක්කර $\frac{3}{4}$ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් තම්මැන්නාඅලවක සුචරිතෝදය දායක සමිතියේ භාරකරුවන් වන ඒ. පින්හාමි උපාසක, ඇස්. හේරත්හාමි, කේ. ඇම්. මැණික්රාල සහ යූ. ඩිංගිරි බණ්ඩා යන මහතුන් විසින් එහි බෞද්ධ විහාරස්ථානයක් පිහිටුවීම සඳහා බදු ඉල්ලා ඇත.

2. අවුරුදු 4ක් පමණ වන බෝධි වෘක්ෂයක් සහ විහාර මන්දිරයක් දැනටමත් ඉඩමෙහි තිබේ. ළඟම ඇති විහාරස්ථානය පිහිටා ඇත්තේ මෙහි සිට සැතපුම් 3ක් පමණ ඈතිනි.

යෝජිත මෙම බෞද්ධ විහාරස්ථානය ප්‍රදේශවාසී බෞද්ධ පවුල් 38කට පමණ ප්‍රයෝජනවත් වේ. ඉඩම මේ සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත.

(අ) බදු මුදල : වර්ෂයකට රු. 1 ශත 50යි ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 5ක් ඇතුළතදී අනුරාධපුර දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි ඉඩමෙහි උපාසකයින් සඳහා මණ්ඩපයක් සහ බෞද්ධ විහාරස්ථානයකට අවශ්‍ය අනිකුත් ගොඩනැගිලි තනා නිම කළ යුතුය ;

(ඉ) බදු ගන්නන් විසින් මෙම ඉඩම බෞද්ධ විහාරස්ථානයක් තැනීම පිණිස මිස අන් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය ;

(ඊ) බදු ගන්නන් විසින් (ආ) ඡේදයෙහි සඳහන් විහාරස්ථානය සාදා නිම කොට සමසක් ඇතුළත එය මහා භාරකාර තැනගේ අනුමැතිය ලද ඔප්පුවකින් පූජා කළ යුතුය. මෙසේ කළ පසු, ප්‍රස්ථාවේ හැටියට, භාරකාර තැනට හෝ විහාරස්ථානයේ පාලක විහාරාධිපතීන් වහන්සේට හෝ ඉඩම සඳහා 99 අවුරුද්දක බද්දක් දෙනු ලැබේ.

3. මෙහි පහත දැක්වෙන දිනයේ සිට සති 6ක් ඇතුළතදී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් යථෝක්ත ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 ජූලි මස 1 වැනි දින,
කොළඹදීය.

---

අංකය: ඇල්. ඈස්. 4201/ඇල්. ඈම්—3/21/376.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නිහත් පත්තුවේ කිරිමැටි වත්ත ගමෙහි පිහිටි ඉහළ කෝන්ගහහේන නමැති රජයේ ඉඩමෙන් අක්කර 2ක් පමණ වූ බිම් කැබැල්ලක් පාසලක් පිහිටුවීම සඳහා ලංකා බෞද්ධායතනය මඟින් බදු ඉල්ලා ඇත. ඉඩමට මායිම්:—

උතුරට: රජයේ කැලෑව සහ කයිරන්ගම සිට හිතෝකඩවලට යන පාර; දකුණට: හිතෝකඩවලට යන පාර සහ කිරිමැටිවැව (මාත); නැගෙනහිරට: කයිරන්ගම හිතෝකඩවල පාර; බටහිරට: කිරිමැටි වැව.

2. අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිගත් පාසලක් දැනටමත් මෙම ඉඩමෙහි පිහිටුවා තිබේ. දැනට මෙම පාසලට ළමයින් 80ක් පමණ පැමිණෙති. ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසි වලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත:—

(අ) කාලය: අවුරුදු 99 යි;

(ආ) බදු මුදල: වර්ෂයකට රු. 5 යි;

(ඇ) බදු ගන්නා විසින් ඉඩමෙහි තනා ඇති පාසල කුරුණෑගල දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි නඩත්තු කළ යුතුයි;

(ඈ) බදු ගන්නා විසින් මෙම ඉඩම පාසල් භූමියක් පිණිස මිස අන් කටයුත්තක් සඳහා නොයෙද විය යුතුය.

3. මෙහි පහත දක්වෙන දිනයේ සිට සති 6ක් ඇතුළත දී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළ හොත් යථෝක්ත ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 ජූලි මස 1 වැනි දින,
කොළඹදී ය.

---

අංකය: ඇල්. ජේ. 1217—ඇල්. ජී. 3601.

## 1948 ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21(2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ එප්පාවල කෝරළයේ මැදියාව පිහිටි රුඩ් 1, පර්චස් 15 ක ප්‍රමාණයකින් යුත් 188 වැනි අවසාන ගම් පිඹුරයේ අංක 26 ඒ 2 දරණ ආණ්ඩුවේ බිම් කට්ටිය ඊට යාබදව ඇති අංක 20 දරණ පෞද්ගලික ඉඩමේ පිහිටි බෞද්ධ විහාරස්ථානයේ කොටසක් වෙනුවෙන් යොදවනු පිණිස මැදියාව පුරාණ විහාරයේ විහාරාධි පතින් වහන්සේ වන පූජ්‍ය මීගස්සැගම ශ්‍රී ජිනරතන ස්වාමීන් වහන්සේ බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. යථෝක්ත විහාරස්ථානයේ දායක වරුන් ට ඉල්ලුම් කර ඇති ඉඩම බල පත්‍රයක් උඩ බදුදී තිබේ. බුද්ධ ප්‍රතිමාවක් සහිත විහාර ගෙයක්, ආවාස කාමරයක්, වැසිකිළියක් හා වැව්ලි සවලපයක් මේ ඉඩමේ තිබේ. මෙම ඉඩම විශේෂ කාරණයකට වෙන්කොට නැති අතර එය ආණ්ඩුවේ හෝ ග්‍රාම්‍ය කටයුත්තකටද අවශ්‍ය නොවේ. සෙසු කොන් දේසි වලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසි වලටද යටත් කොට මෙම ඉඩම බදු දීමට යෝජනා කර ඇත:—

(අ) කාලය: 1962.8.3 දින බද්ද අවසන්වේ;

(ඉ) බද්ද: අවුරුද්දකට රු. 1 යි;

(උ) බදු ගන්නා විසින් මෙම ඉඩම බෞද්ධ විහාරස්ථානයක් වෙනුවෙන් යොදනවා මිසා අන්‍ය කටයුත්තකට නොයෙද විය යුතුයි.

(එ) බදු ගන්නා විසින් අනුරාධපුර ආණ්ඩුවේ ඒජන්ත තුමාගේ කැමැත්ත ලියවිල්ලකින් ලබා නොගෙන මෙම ඉඩමෙහි අන්‍ය ස්ථිර ගොඩනැගිලි ඉදි නොකළ යුතුයි;

(ඔ) බදු ගන්නා විසින් මෙම ඉඩම හා එහි ඇති ගොඩනැගිලි අනුරාධපුර ආණ්ඩුවේ ඒජන්ත තුමාගේ සිත් ගන්නා පරිද්දෙන් බලා ගත යුතුයි.

3. මෙහි සඳහන් දින සිට සති හයක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළ හොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

4. 1957 ජූලි මස 5 වැනි දිනවූ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ නිවේදනය මෙයින් අවලංගු කරමි.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 ජූලි මස 1 වෙනි දින,
කොළඹදීය.

---

අංකය: ඇල්. ජේ. 1483-3/21/438.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුවේ, නැගෙනහිර ඉහළ විසිදෙකේ කෝරළයේ, බලවත්තල ගමෙහි, අංක 1,148 දරණ අවසාන ගම් පිඹුරයේ, අංක 67 දරණ බිම් කැබැල්ලෙන් අක්කර 2ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක්, මුදිගල ආරණ්‍ය සේනාසන වර්ධන සමිතියේ භාරකරුවන් වන, බලවත්තල පදිංචි, දිසානායක මුදියන්සෙලාගේ විල්මට් සිරිසේන, කොස්වත්තේ පදිංචි, අධිකාරි මුදියන්සෙලාගේ පුංචිරාළ සහ දොඩන්ගස්ලන්දේ පදිංචි, රත්නායක මුදියන්සෙලගේ ලූවිස් බන්ඩාර යන මහතුන් විසින් එහි බෞද්ධ විහාරස්ථානයක් පිහිටුවීම සඳහා බදු ඉල්ලා ඇත.

2. ඉල්ලුම් කර ඇති ඉඩමෙහි නටබුන් සමහරක් තිබේ. ළඟම ඇති බෞද්ධ විහාරස්ථානයට මෙහි සිට සැතපුම් 2 ක් පමණ තිබේ. යෝජිත මෙම බෞද්ධ විහාරස්ථානය 300 ක් පමණ වූ බෞද්ධයින්ට ප්‍රයෝජන වත් වේ. මේ සඳහා ඉඩම බදු දීමට පුළුවන: එබැවින්, රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත:—

(අ) බදු මුදල: වර්ෂයකට රු. 1 යි;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 1 ක් ඇතුළතදී, කුරුණෑගල දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි ඉඩමෙහි (භාවනා මධ්‍යස්ථානයක් ඇතුලු) ආරණ්‍යයක් පිහිටුවා, භික්ෂූන් වහන්සේලා සඳහා වාසස්ථාන සහ රැස් වීම් ශාලාවක් තනා නිම කළ යුතු ය;

(ඇ) බදු ගන්නන් විසින් මෙම ඉඩම බෞද්ධ විහාරස්ථානයක් තැනීම පිණිස මිස අන් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඈ) බදු ගන්නන් විසින් පුරාවිද්‍යා අධිකාරීන්ගෙන් කලින් ලිය විල්ලකින් ලබාගත් අවසරයක් නොමැතිව ඉඩමෙහි කිසිම හෑරීමක් නොකළයුතුය;

(ඉ) බදු ගන්නන් විසින්, ඉඩමෙහි තිබී කිසියම් පුරාවස්තුවක් සම්භ වුවහොත් ඒ බව එසේ සම්භ වී දින 7 ක් ඇතුළත කුරුණෑගල දිසාපති තැනගේ මාර්ගයෙන් පුරාවිද්‍යා අධිකාරීන්ට දැන් විය යුතුය. එවැනි පුරාවස්තූන් 1940 අංක 9 දරණ පුරාවිද්‍යා ආඥාපණතෙහි ඇතුළත් විධි විධානවලට යටත්ව රජයේ නියත අයිතියට අයත් දේපල ලෙස පවතිනවා ඇත;

(ඊ) බදු ගන්නන් විසින් ඉඩමෙහි ඇති කිසිම ශිලා ලිපියක් අප පත නොකළ යුතුය;

(උ) බදු ගන්නන් විසින් පුරාවිද්‍යා අධිකාරීන්ගෙන් කලින් ලිය විල්ලකින් ලබා ගත් අවසරයක් නොමැතිව ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදි නොකළ යුතුය;

(ඌ) බදු ගන්නන් විසින් (ආ) ඡේදයෙහි සඳහන් ගොඩනැගිලි සාදා නිම කොට සමසක් ඇතුළත මහාභාරකාර තුමා විසින් අනුමත කරන ලද ඔප්පුවකින් මෙම සිද්ධස්ථානය මහා සංඝ රත්නයට පූජා කළ යුතුය. එසේ කරනු ලැබූ පසු, ප්‍රස්ථාවේ හැටියට, මෙම ඉඩම, භාරකරුට හෝ පාලක විහාරාධිපතීන් වහන්සේට හෝ 99 අවුරුද්දකට බදු දෙනු ලැබේ.

3. මෙහි පහත දක්වෙන දිනයේ සිට සති 6 ක් ඇතුළතදී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් යථෝක්ත ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 ජූලි මස 1 වෙනි දින,
කොළඹදීය.

## අනුරාධපුර දිසාවේ අංක 706 දරණ අවසාන ගම් පිඹුරේ කට්ටි 16න් කොටසක බද්ද පැට්රල් සේවා මධ්‍යස්ථානයක් සඳහා වෙන්දේසියේ විකිණීමයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති තුමා (මින් ඉදිරියට දිසාපති තුමා යනුවෙන් හඳුන්වනු ලබන) විසින් 1960 අගෝස්තු 3 දින පෙරවරු 9 ට අනුරාධපුර දිස්ත්‍රික්කයේ බටහිර නුවරගම් පළාතේ කඳුවැව නම් ගමෙහි පිහිටි අංක 706 දරණ අවසාන ගම් පිඹුරේ කට්ටි 16න් අක්කර 1/8 ප්‍රමාණ රජයේ ඉඩම් කැබැල්ලක බද්ද පැට්රල් සේවා මධ්‍යස්ථානයක් සඳහා ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසියේ විකිණීම පටන් ගැනීමේදී ලන්සයක් තබනු ලැබේ. රුපියල් 250ක් වන එම ලන්සයට පහත ඉල්ලීම් භාරගනු නොලැබේ.

3. වෙන්දේසියේ ඉල්ලීම් බාර ගැනීමට පෙර, ඉල්ලුම්කරුට බද්දේ කොන්දේසි අනුගමනය කළ හැකි ද යන්න ගැන සියලු වග තුග දිසාපති තුමා විසින් සොයා බැලීමට ඉඩ තිබේ. තෙල් සමාගමක ඒජන්ත කෙනෙක් හෝ බලයලත් කෙනෙක් හෝ නොවන අයගේ ඉල්ලීම් භාරගනු නොලැබේ. එසේ නොමැති අයකු ඉල්ලූ අවස්ථාවේදී එය පරීක්ෂාකර බලා දිසාපති තුමා විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂෙප කොට නැවත වෙන්දේසිය පවත්වාගෙන යනු ලැබේ.

4. ඉහත කී ස්ථානයේ නියම වේලාවට සෑම ඉල්ලුම්කරුවෙක්ම හෝ ඔහු විසින් බලය පැවරූ අයෙක් පෙනී සිටිය යුතුයි. වෙන්දේසිය පටන් ගැනීමට පෙර එය දන්වා එවූ ලිපිය ඉදිරිපත් කළ යුතුයි.

5. වෙන්දේසියෙන් තෝරුන තැනැත්තා—

(අ) වෙන්දේසියට අනතුරුව ඔහු ඉල්ලූ මුදල හා පළමු වර්ෂයේ කුලියද ගෙවිය යුතුයි.

(ඉ) දින 14ක් ඇතුළතදී පොරොන්දු පත්‍රයට ඇතුළත් විය යුතුයි.

මෙකී (අ) නොහොත් (ඉ) යන කොන්දේසි නිසියාකාර ඉටු නොකළ විට ඒජන්ත තුමා විසින් බද්ද විකිණීම අවලංගු කොට ඉල්ලුම්කරු විසින් ගෙවන ලද යම් මුදලක් වේ නම් එය රාජසන්තක කිරීමට ඉඩ තිබේ.

6. බද්දෙහි වෙනත් කොන්දේසිවලට අමතරව යටත් කොන්දේසි ඇතුළත් වේ:—

(අ) කාලය: අවුරුදු 20යි;

(ආ) කුලිය: වර්ෂයකට රුපියල් 20යි;

(ඇ) බදුකරු බද්ද බාර ගෙන මාස හයක් ඇතුළත අනුරාධපුර දිසාපති තුමා විසින් පූර්වයෙන් අනුමත කරන සැලැස්මකට අනුව එම බිමෙහි ස්ථිර පැට්රල් සේවා මධ්‍යස්ථානයක් පිහිට විය යුතුයි. පූර්වයෙන් ලියා ඉල්ලාගත් අවසරයක් නොමැතිව ඔහු යටකී ගොඩනැගිල්ලට එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් කළ නොහැක;

(ඈ) දිසාපති තුමාගේ අවසරයක් නොමැති බදුකරු විසින් ඉඩම පැට්රල් සේවා මධ්‍යස්ථානයකට හැර අන් දෙයකට නොයෙදිය යුතුයි;

(ඉ) බදුකරු දිසාපති තුමාගේ සෑහීමට හේතුවන පරිදි බෝක්කු යනාදිය ඇතිව ඉම ස්ථානයට පාර සෑදිය යුතුයි;

(ඊ) බදුකරු ඉඩම් කොමසාරිස් තුමාගෙන් කලින් ලබාගත් අවසරයක් නොමැතිව මෙම ඉඩම අන් අයෙකුට පැවරීම, කුලියට දීම, උගස් කිරීම හෝ වෙනයම් ක්‍රමයකින් අන්සතු කිරීම නොකළ යුතුයි;

(උ) බදුකරු ඉඩම හා එහි ගොඩනැගිලි සඳහා ගෙවිය යුතු වරිපනම් හා වෙනත් තක්සේරු ගාස්තු ගෙවිය යුතුයි;

(ඌ) බද්ද අවසන් වූවාට පසු හෝ අවසන් වන්නට පෙර බදුකරුගේ කැමැත්තෙන් අස්වන්නේ නම් ඔහුට එහි තිබෙන ගොඩනැගිලි සියල්ල කඩා ඉවත්කර ගත හැකිය. මෙසේ කිරීමේදී මොනයම් කරුණක් නිසාවත් ඉඩමට හානියක් නොකිරීමට වග බලා ගත යුතුයි;

(එ) ඉඩමෙහි ඉතිරි ගොඩනැගිලිවලට හෝ වෙන කිසියම් දෙයකට වන්දි මුදලක් ගෙවනු නොලැබේ.

7. මේ පිළිබඳ වැඩිපුර විස්තර අනුරාධපුර දිසාපති තුමාගෙන් දැන ගත හැක.

ජේ. ඊ. දුඹුකොල,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරි,
අනුරාධපුර දිසාපතිතුමා වෙනුවට.

1960 ජූනි මස 22 දින,
අනුරාධපුර දිසාපති කායර්‍යාලයේදිය.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නාමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේ යි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම **පස්වරු 3.30ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කායාීංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. **පරණ** ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ ප්‍රකාශන කායාීංශයේ අධිකාරි තැනගෙන්** ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.